**9/OL/INS/PR/01**

මගේ අංකය : 9/3/1/OL/2026/01,
පාසල් විභාග ඇගයීම් ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

2026 සැප්තැම්බර් මස 10 වන දින.

සියලුම විදුහල්පතිවරුන් වෙත,

**අ.පො.ස. (සා/පෙළ) විභාගය - 2026**
**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා අයදුම් පත්‍ර කැඳවීම.**

උක්ත විභාගය 2026.12.08 වන දින සිට 2026.12.17 වන දින තෙක් පැවැත්වීමට නියමිතය. මෙම විභාගයේ උත්තර පත්‍ර කඩිනමින් ඇගයීම් කර ප්‍රතිඵල ලබා දීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව කටයුතු සංවිධානය කර ඇත. මෙම ජාතික කර්තව්‍යය සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ පාසලේ ගුරු මහත්ම මහත්මීන් උත්තර පත්‍ර ඇගයීම් කිරීමේ කාර්යය සඳහා අයදුම් කිරීමට දිරි ගැන්වීමටත්, උත්තර පත්‍ර ඇගයීමට අපේක්ෂා කරන ගුරුභවතුන්ගේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඔබ දක්වන සහාය ඉතා අගය කරමි.

මේ සඳහා පහත උපදෙස් කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

1. අයදුම් පත්‍ර කැඳවීම මාර්ගගත ක්‍රමයට පමණක් සිදු කරනු ලබන අතර 2026.09.10 දින සිට 2026.09.23 දින තෙක් **<u>www.doenets.lk</u>** වෙබ් අඩවිය මගින් හෝ **<u>www.onlineexams.gov.lk</u>** වෙබ් ලිපිනය මගින් හෝ අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීමට හැකියාව ඇත. අයදුම් පත්‍ර යොමු කිරීමට අපේක්ෂා කරන සියලුම ගුරුභවතුන්ට **<u>මාර්ගගත ක්‍රමයට පමණක් අයදුම් පත්‍ර යොමුකරන</u>** ලෙස උපදෙස් ලබා දිය යුතු ය. **(2026.09.23 දිනට පසුව ලැබෙන කිසිදු අයදුම් පත්‍රයක් භාරගනු නොලැබේ.)**

2. මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කරන ලද 10/ 11 ශ්‍රේණිවලට අදාළ කාලසටහන නිවැරදි බවට ඔබ හෝ නියෝජ්‍ය විදුහල්පති විසින් සහතික කළ යුතු ය.

3. අයදුම්පත්‍රයේ සෑම කොටසකටම අදාළව නිවැරදිව තොරතුරු ලබා දීමට ගුරු භවතුන්ට විශේෂයෙන් උපදෙස් ලබා දිය යුතු ය.

4. එසේම අයදුම්කරු නිවැරදි තොරතුරු ඇතුළත් කර සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන අයදුම් පත්‍ර පමණක් ඔබ විසින් ඇගයීම් සඳහා නිර්දේශ කළ යුතු ය.

❖ ඉතා වැදගත්

5. අයදුම් පත්‍රයේ මාර්ගගතව නිර්දේශය ලබා දිය යුතු කොටස් නිවැරදිව සම්පූර්ණ කර, එම නිර්දේශ මාර්ගගත ක්‍රමයට (Online) විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම ඔබගේ රාජකාරි වගකීම වේ. මේ සඳහා <u>www.onlineexams.gov.lk</u> දිගුව (link) හරහා විභාග දෙපාර්තමේන්තුව විසින් ඔබ වෙත මීට පෙර ලබා දී ඇති පරිශීලක නාමය (User Name) හා මුරපදය (Password) යොදා ගනිමින් පද්ධතිය වෙත පිවිසිය යුතු ය. පිවිසීමෙන් පසු එහි දිස්වන **"G.C.E (O/L) Examinations - 2026 - Marking examiners verification"** යන්න තෝරා ගත යුතු ය. මෙහි දී ඇගයීම් සඳහා ඉල්ලුම්කර ඇති ඔබ පාසලේ පරීක්ෂකවරුන්ගේ ලැයිස්තුව ඔබට දිස්වන අතර, Edit බොත්තම (Button) භාවිතයෙන් අදාළ නිදේශ ලබා දී Submit බොත්තම භාවිතයෙන් එම දත්ත පද්ධතිය වෙත යොමු කළ යුතු ය. (එක් එක් පරීක්ෂකවරයා වෙන් වෙන් වශයෙන් නිර්දේශ කිරීම අත්‍යවශ්‍ය වේ.) එසේ ඔබගේ නිර්දේශ ලබා දීමෙන් පසුව Principal's Certificate බොත්තම භාවිතයෙන් සාරාංශ වාර්තාව බාගත (Download) කර ගත යුතුය.

6. බාගත කර මුද්‍රණය කරන ලද සාරාංශ වාර්තාවේ (Summary PDF) නිර්දේශ කරන ලද සියලුම අයදුම්කරුවන්ගේ තොරතුරු නිවැරදිව ඇතුළත් ද යන්න පරීක්ෂා කිරීමෙන් අනතුරුව **(මෙය නිවැරදිව පරීක්ෂා නොකිරීම මත ගුරුවරුන්ට ඇගයීම් අවස්ථා අහිමි විය හැක.)** එය සහතික කර අවශ්‍ය අවස්ථාවක දී ඉදිරිපත් කිරීම සඳහා පාසලේ ගොනු කර තැබිය යුතුය. **නවක අයදුම්කරුවන්ගේ පමණක් අයදුම් පත්‍රවල දෘඪ පිටපත් (Hard copies) අදාළ සුදුසුකම් සනාථ කරන සහතිකවල (පත්වීම් ලිපිය හා අධ්‍යාපන සහතික) සත්‍යාපනය කරන ලද පිටපත් සමග අමුණා 2026.09.23 දිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.**

**විභාග කොමසාරිස් ජනරාල්,**
**පාසල් විභාග ඇගයීම් ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. 1503,**
**කොළඹ.**

(ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උත්තර පත්‍ර පරීක්ෂකවරුන් තෝරා ගැනීම සඳහා අයදුම් පත්‍ර, අ.පො.ස.(සා/පෙළ) විභාගය - 2026"** ලෙස සඳහන් කරන්න.)

**වැඩිදුර විමසීම් :**

| | | | |
|---|---|---|---|
| 011 - 2784037 | - පී.ආර්. දේවබන්දු මයා | - විභාග කොමසාරිස් | - (පාසල් විභාග ඇගයීම්) |
| 011 - 2785633 | - සී. ක්‍රිෂ්ණගෝපි මිය | - නියෝජ්‍ය විභාග කොමසාරිස් | - (පාසල් විභාග ඇගයීම්) |
| 011 - 2785216 | - එච්.ටී.සී.ඩී.පී. සිරිවර්ධන මිය | - නියෝජ්‍ය විභාග කොමසාරිස් | - (පාසල් විභාග ඇගයීම්) |
| 011 - 2785644 | - පී.පී.එච්.ඒ.ඒ. ජයතිලක මයා | - නියෝජ්‍ය විභාග කොමසාරිස් | - (පාසල් විභාග ඇගයීම්) |
| 011 - 2786552 | - එම්.ඩබ්.එස්.සී. වීරසිංහ මයා | - සහකාර විභාග කොමසාරිස් | - (පාසල් විභාග ඇගයීම්) |
| 011 - 2785231/0112785681 | - පාසල් විභාග ඇගයීම් ශාඛාව | | |

**තාක්ෂණික සහාය සඳහා :**

මාර්ගගත ශාඛාව - 011 3661122

**පී.ආර්. දේවබන්දු**
විභාග කොමසාරිස්
පාසල් විභාග ඇගයීම්

**අත්/කලේ :- ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ**
විභාග කොමසාරිස් ජනරාල්